අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2020
------------------------------------------------------------------

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු 2016 දෙසැම්බර් 01 දිනැති අංක සීඑල්කේ - 100901 ආර් දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය අතර 2017 අගෝස්තු 31 වන දින එළඹි සංශෝධිත ණය පහසුකම් ගිවිසුමේ 3.4.4 වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව
------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් රැක ගනිමින් අනුරාධපුර නගරයේ පෞරාණික හා නවීකරණය වූ ප්‍රදේශ අතර සමබර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 9,779.95 කට සමාන යුරෝ මිලියන 62.4 ක් වන අතර ඉන් රු. මිලියන 8,149.96 කට සමාන යුරෝ මිලියන 52 ක් සැපයීමට ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිමකිරිමට නියමිතය.

**1.3** මතය
------

ව්‍යාපෘතියෙහි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4** මතය සඳහා පදනම
------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම
------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළිවෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳව නිසි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම
------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ වැඩකටයුතුවල භෞතික කාර්යසාධනය

අනුරාධපුර සහභාගීත්ව නගර කලාපය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නාගරික යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචකය | කාර්යය | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | අනුරාධපුර නගරයේ තිරසාර යටිතල | විස්තරාත්මක නිර්මාණකරණ අධ්‍යයනය සඳහා | (i) විස්තරාත්මක නිර්මානකරණ අධ්‍යයනය සඳහා උපදේශන සේවාව රු.මිලියන 212.66 ක | උපදේශන සමාගමේ දුර්වල කාර්යසාධනය හා සුපරීක්ෂණයක් | අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2021 මැයි මාසයේදී | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන |

| | | | | | |
|---|---|---|---|---|---|
| පහසුකම් හඳුනා ගැනීම | උපදේශක සේවා | (යුරෝ මිලියන 1.18) මුදලකට ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය හා ශෆ් හිට් ග්‍රීන් ටෙක් උපදේශක සමාගම අතර 2017 අගෝස්තු 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව, උපදේශන සමාගම විසින් 2018 ඔක්තෝබර් 12 දින උපදේශන වාර්තා ලබාදිය යුතුව තිබුණි. එසේ වුවත්, අදාල වාර්තා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ඉදිරිපත් කර නොතිබුණු අතර ව්‍යාපෘතිය මඟින් ගිවිසුම් කාලය 2020 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. එසේ වුවද, ඇතැම් භාරදිය යුතු කොටස් 2021 මැයි මාසය දක්වා නිමකර නොතිබුණු අතර ගිවිසුමේ කාලය දීර්ඝ කිරීමක් 2020 අප්‍රේල් මාසයෙන් පසුව සිදුකර නොතිබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ උපදේශක සමාගම වෙත රු.මිලියන 42.11 ක ගෙවීමක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබීම විගණනයේදී ප්‍රශ්ණ සහගත කරුණක් විය. උපදේශන ආයතනය වෙත රු.මිලියන 100.32 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවා තිබුණද වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය වෙනුවෙන් අයකර ගත යුතුව තිබුණු රු.මිලියන 50.24 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | නොවීම. | වෙනත් ප්‍රසම්පාදන කමිටුවක් පත් කර ලදී. කොන්ත්‍රාත් කාලය (EOT) දීර්ඝ කිරීම සම්බන්ධව සමාලෝචනය කරමින් පවතින අතර එහිදී ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධව සලකා බලනු ඇත. | අනුගමනය කර ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. |
| | | (ii) අතිරේක විශේෂඥයන් 6 දෙනෙකු හා ප්‍රධාන විශේෂඥයන් දෙදෙනෙකු විස්තරාත්මක නිර්මාණකරණ උපදේශන සේවා ගිවිසුමේ අදාල සඳහන් අවශ්‍ය සුදුසුකම් | උපදේශන සමාගමේ දුර්වල කාර්යසාධනය හා සුපරීක්ෂණයක් නොවීම. | එකඟ වේ. | ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීම තුළින් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් හා |

| | | | | |
|---|---|---|---|---|
| | සපුරා නොතිබුණු බව නිරීක්ෂණය විය. | | | ඵලදායී උපදේශන සේවා කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (iii) | විස්තරාත්මක ඉංජිනේරු නිර්මාණ නාගරික ආංශික වර්ගීකරණ සංරචකය (වාස්තු විද්‍යාත්මක හා ව්‍යුහාත්මක) සංරචකයේ විස්තරාත්මක ඉංජිනේරු නිර්මාණ සැලසුම්වල විශ්ලේෂණ වාර්තා 11 ක් ඉදිරිපත් කිරීමට මාස 6කට වඩා ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියට වෙන්කර තිබුණු රු.මිලියන 75 ක් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. කළමනාකරණයට සහාය විය හැකි ව්‍යාපෘති විශේෂඥයන් 2020 මැයි මාසය දක්වා බඳවා නොගැනීම සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ පැවති විශේෂඥතාවෙහි අඩුකම මෙකී ප්‍රමාදයන්වලට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. | උපදේශන සමාගමේ දුර්වල කාර්යසාධනය හා සුපරීක්ෂණයක් නොවීම. | එකඟ වේ. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් හා ඵලදායී උපදේශන සේවා අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |

**2.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුරාධපුර දුම්රිය ස්ථානයේ ඇති මහජන චතුරශ්‍රය සහ අනුරාධපුර සිංහ කණුව වට රවුම රු.මිලියන 122.62 ක ඇස්තමේන්තුගත මුදලින් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2021 ජූලි මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට මුළු එකතුව රු.මිලියන 17.99 ඒ සඳහා වැයකර තිබුණද, එහි භෞතික ප්‍රගතිය සියයට 4 ක් තරම් ඉතා පහල මට්ටමක විය. ප්‍රමාණ පත්‍රිකා සහ නිර්මාණ සැලසුම්වල නොගැලපීම මෙයට ප්‍රධාන හේතු වී | නිරීක්ෂණය හා එකඟ වේ. මෙම නිර්මාණ සැලසුම් වෙනස් කිරීම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතියට බලපාන ලදී. | ව්‍යාපෘතියේ කාර්යයන් නිම කිරීම මගින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් හා ඵලදායී කොන්ත්‍රාත් පරිපාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරය සහ ව්‍යාපෘති අතර මනා සම්බන්ධීකරණයක් නොවීම නිසා සිංහ කණුව පෙදෙස සඳහා මීට පෙර නිර්මාණය කර තිබුණු සැලසුම් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් නැවත වෙනස් කිරීමට දන්වා තිබුණි. | | |
| (ආ) | උප ව්‍යාපෘති **4** ක කොන්ත්‍රාත් කටයුතු රු.මිලියන **336.25** ක ඇස්තමේන්තුගත පිරිවැයකට ප්‍රදානය කර තිබුණු අතර එම කොන්ත්‍රාත් කටයුතු **2021** ජූලි මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත්, එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති **3** ක ප්‍රගතිය සියයට **10** ත් සියයට **30** ත් අතර වූ පහල මට්ටමක විය. ප්‍රමාණ පත්‍රිකා සහ නිර්මාණ සැලසුම්වල නොගැලපීම ප්‍රමාදයට ප්‍රධාන හේතුව වී තිබුණි. මේ අනුව උපදේශකවරුන් පිළියෙල කළ මූලික ලියවිලි සමාලෝචනය කිරීම හා උපදේශකවරුන්ගේ වාර්තා සඳහා අනුමැතිය ලබාදීම විගණනයේදී ප්‍රශ්ණකාරී තත්ත්වයක් විය. මෙකී වෙනස්කම් හේතුකොටගෙන කොන්ත්‍රාත්තකරුවන් විචලතා වාර්තාවන් පිළියෙල කර අතිරේක පිරිවැය ව්‍යාපෘතියෙන් ඉල්ලුම් කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | නිර්මාණ සැලසුම් හා විස්තරාත්මක සැලසුම් ඇගයීමෙන් පසුව ප්‍රමාණ පත්‍රිකා පිළියෙල කළ යුතුය. |

**2.3** නිශ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්
---------------------------------------

| | විගණන නිරීක්ෂණය<br>------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>--------------------------- | විගණකගේ නිර්දේශය<br>-------------------- |
|---|---|---|---|
| (අ) | ලැබුණු තොරතුරුවලට අනුව, ණය ලබාදීමේ නියෝජිතායතනය මඟින් ලබා දී තිබුණු රු.මිලියන **8,354.32** කට සමාන යුරෝ මිලියන **52** ක මුදලින්, ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කර **2020** දෙසැම්බර් **31** දිනට අවුරුදු **4** ක් ගතවී තිබුණද උපයෝජනය කර තිබුණේ යුරෝ මිලියන **1.84** කට සමාන රු.මිලියන **308.84** ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට **3** ක් පමණි. එසේම ව්‍යාපෘතිය මඟින් යුරෝ මිලියන **1.72** කට සමාන රු.මිලියන **204.25** ක් **2018** වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් කිසිවක් ලබාගෙන නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. එසේම **2018** වර්ෂයේදී ලබාගෙන තිබුණු අත්තිකාරම් මුදලින් යුරෝ මිලියන **0.17** ක සමාන රු.මිලියන **26.25** ක් උපයෝජනය කිරීමකින් තොරව බැංකු ගිණුම්වල රඳවාගෙන තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | ව්‍යාපෘතියේ අරමුදල් ඵලදායී හා ආර්ථිකමය වශයෙන් උපයෝජනය කිරීමට හැකිවන පරිදි ශක්තිමත් හා ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය. |

**2.4** මතභේදයට තුඩුදෙන කරුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | අනුරාධපුර උප ව්‍යාපෘතියෙහි අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ නිවාසය මිල ගණන් කැඳවා කුලී පදනම මත ලබා ගැනීමට කටයුතු කර තිබුණි. නිවාසය කුලියට ගැනීම සඳහා **2018** නොවැම්බර් **14** දින රු.**100,000** ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. එසේ වුවත්, මෙම නිවස පදිංචිය සඳහා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ගෙවා තිබුණු අත්තිකාරම් මුදල **2021** අප්‍රේල මාසය දක්වාම නැවත අයකරගෙන නොතිබුණි. එසේම, ව්‍යාපෘතියෙහි අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට රු.**70,000** මාසික කුලී පදනම මත නිවාසයක් ලබාදීම සඳහා රු.**210,000** ක අත්තිකාරම් මුදලක් ගෙවා ගිවිසුම් අත්පත් කර තිබුණි. ඉන්පසුව **2018** ඔක්තෝබර් **08** දින සිට **2019** ජුනි **13** දින දක්වා රු.**520,333** ක් කුළ වශයෙන් ගෙවා තිබුණි. එසේවුවත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අංක **1/2016** චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි දක්වා තිබුණු කරුණුවලට අනුව එම නිසා හිමිකරු වෙත **2020** මැයි **13** දින භාරදී තිබුණි. එසේ වුවද, රු.**109,670** ක් වූ ලැබිය යුතු අත්තිකාරම **2021** අප්‍රේල් මාසය දක්වා අයකර ගැනීමට කටයුතු නොතිබුණි. | නිවාස හිමිකරුට ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත ගෙවන ලෙස දන්වා තිබුණද, ඔහු නැවත එය ගෙවා නොතිබුණි. | ගෙවන ලද අත්තිකාරම් මුදල කඩිනමින් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය ආරම්භ කර අවුරුදු **4** ක් ගතවී තිබුණද, ව්‍යාපෘතිය යටතේ සිදුකළ යුතු සංවර්ධන කටයුතු සඳහා වැයකර තිබුණේ රු.මිලියන **96** ක් පමණි. එසේ වුවත්, පසුගිය අවුරුදු **4** ක කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති කළමනාකරණ වියදම රු.මිලියන **183.98** ක් හෙවත් සංවර්ධන වියදම්වලින් සියයට **50** ක වැඩි ප්‍රමාණයක් විය. ඒ අනුව, ව්‍යාපෘතින් ඵලදායිත්වය හා කාර්යසාධකතාවය විගණනයේදී ගැටලුකාරී තත්ත්වයක් විය. | එකඟ වේ. එසේවුවත් විස්තරාත්මක උපදේශන නිර්මාණ සැලසුම් ප්‍රමාද වූයේ තෝරාගත් උපදේශකවරුන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙනි. | ව්‍යාපෘතියේ මූල්‍ය සැලසුම්වලට අනුකූලව ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපෘති අරමුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රු.මිලියන **877** ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ඉදිකිරීමට උපදේශන ආයතනය විසින් යෝජනා කර තිබුණු පොල ගොඩනැගිල්ල සහ මහල් සහිත මෝටර් රථ නැවතුම් අංගනය ඉදිකිරීම් අදියරේදී මහජනයාට සිදුවිය හැකි අපහසුතාවයක් හා වන්දි ගෙවීමේ ප්‍රශ්ණකාරී තත්ත්වයන් හේතුවෙන් අත්හැරදමා තිබුණි. මෙම නිසා ව්‍යාපෘතිය මඟින් විධිමත් අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය කාර්යයන් හඳුනාගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | වෙළෙඳපල සංවර්ධන කටයුතු සඳහා අරමුදල් යෙදවීම ව්‍යාපෘතියේ ණය යෙදවීම් විෂය පථයට නොගෙනෙන නිසා පොළ ගොඩනැගිල්ල හා මහල් සහිත මෝටර් රථ අංගනයේ ඉදිකිරීම් කටයුතු ප්‍රංශ සංවර්ධන | ව්‍යාපෘති කටයුතු සැලසුම් කිරීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු සඳහා බලපෑ හැකි සියලුම සාධක සැලකිල්ලට ගෙන සියලුම කටයුතු ඇගයීමට ලක්කළ යුතුය. |

**2.5** මානව සම්පත් කළමනාකරණයට අදාල නිරීක්ෂණ

| | කාර්ය මණ්ඩල තත්ත්වය | අනුමත (තනතුරු සංඛ්‍යාව) | 2020 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | නාගරික උරුමයන් පිළිබඳ විශේෂඥ | 01 | - | 01 | අදහස් දක්වා නොතිබුණි. | අවශ්‍යතාවය අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ | 03 | - | 03 | | |
| (ඇ) | අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | - | 01 | | |
| (ඈ) | වෙනත් | 22 | 18 | 06 | | |

**2.6** අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියෙහි තථ්‍ය පිරිවැය ඇස්තමේන්තුගත පිරිවැය සමඟ සැසඳීමේදී සියයට 50 ක් පමණ වූ විචලතාවයන් නිරීක්ෂණය විය. මේ අනුව, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | උපදේශන සේවා සැපයීමේ ප්‍රමාදයන් නිසා අයවැය ප්‍රතිපදානවල ඉතිරිවීම් ඇති විය. | ව්‍යාපෘතියේ කාර්යයන් කාර්යක්ෂම ලෙස කරගෙන යාම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂම ලෙස සැලසුම් කර නිර්මාණය කළ යුතුය. |